# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2260/62 – 2021 දෙසැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා – 2021.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : සී.අයි - 1858.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

එක් පාර්ශවයක් වශයෙන් ශාන්ති මාවත, මාකුඹුර, පන්නිපිටිය හි පිහිටා ඇති මිදායා සෙරමික් කම්පැණි පුද්ගලික සමාගම සහ අනෙත් පාර්ශවය වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 හි පිහිටා ඇති අන්තර් සමාගම් සේවක සංගමය අතර 2020 ඔක්තෝබර් මස 16 වැනි දින ඇතිකරගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුව.

**2020 අංක 14 දරන සාමූහික ගිවිසුම**

1A – G 35718 – 14 (2021/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මිදායා සෙරමික් කම්පැනි පුද්ගලික සමාගම සාමූහික ගිවිසුම - 2020

කාර්මික ආරාවුල් පනතේ වගන්ති ප්‍රකාරව 2020 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම සාමූහික ගිවිසුම සමාගමක් ලෙස අංක 1982 අංක 07 දරන සමාගම් ආඥා පනත යටතේ නියමිත පරිදි ස්ථාපිත කර ඇති සහ 2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ නියමිත පරිදි නැවත ලියාපදිංචි වී ඇති සිය ලියාපදිංචි කාර්යාලය ශාන්ති මාවත, මාකුඹුර, පන්නිපිටිය යන ලිපිනයේ පිහිටි මිදායා සෙරමික් කම්පැනි පුද්ගලික සමාගම එක් පාර්ශවයකුත් (මින් පසු සේවායෝජක වශයෙන් හඳුන්වනු ලබන) හා වෘත්තිය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි වී ඇති සිය ලියාපදිංචි කාර්යාලය තලංගම කොස්වත්ත සෙත්සිරි මාවතේ අංක 259/9 යන ස්ථානයේ පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය (මින් පසු වෘත්තීය සමිතියක් වශයෙන් හඳුන්වනු ලබන අනෙකුත් පාර්ශවයන් වශයෙන් එම පාර්ශවයන් අතර වර්ෂ 2020 ඔක්තෝබර් මස 16 වැනි දින ගිවිස ගන්නා ලදී.

පාර්ශවයන් විසින් එකගතාවයකට පැමිණි කරුණු පහත පරිදි වේ.

මෙම සාමූහික ගිවිසුම මිදායා සෙරමික් කම්පැනි පුද්ගලික සමාගම - සාමූහික ගිවිසුම 2020 වශයෙන් හඳුන්වනු ලැබේ.

**01. ආවරණය සහ බැඳෙන සේවකයින්**

විධායක ශ්‍රේණිවල හැර 2020 ඔක්තෝබර් මස 01 දිනට සේවා යෝජකයාගේ සේවා නියුක්තියේ යෙදී සිටින සියලුම ස්ථිර සේවකයින් මෙම ගිවිසුමෙන් ආවරණය වී බැඳී සිටී. (පරිවාස සහ කොන්ත්‍රාත් සේවකයින් මෙම ගිවිසුමෙන් ආවරණය නොවේ.)

**02. ක්‍රියාත්මක වන දිනය හා කාලසීමාව**

මෙම ගිවිසුම 2020 ඔක්තෝබර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන අතර, 2022 මාර්තු මස 31 වැනි දින තෙක් අවසන් නොවෙනු ඇත. මෙම ගිවිසුම මසක ලිඛිත දැනුම්දීමක් කර අවසන් කර හැකි නමුත් 2022 මාර්තු 31 වැනි දිනට පෙර නිකුත් කරනු ලබන වෙනත් කිසිදු පූර්ව දැන්වීමක් කිසිසේත් බලනොපැවැත්වෙනු ඇත.

**03. වැටුප් වැඩිවීම**

2020.10.01 දින සිට 2021.03.31 දක්වා බලපැවැත්වෙන පරිදි සියලු අදාළ ස්ථිර සේවකයින් සඳහා රු. 2000 ක වැටුප් වැඩිවීමක් ලබා දීමට එකග වේ.

2021.04.01 දින සිට 2022.03.31 දක්වා බලපැවැත්වෙන පරිදි සියලු අදාළ ස්ථිර සේවකයින් සඳහා රු. 2000 ක වැටුප් වැඩිවීමක් ලබා දීමට එකග වේ.

04. මීට අමතරව වෙනත් කිසිදු ආකාරයක මුල්‍යමය වැඩිවීමක් මෙම ගිවිසුමේ කාල සීමාව තුළ සිදු නොවන බවට පාර්ශවයන් එකග වේ.

05. සේවකයින් සේව්‍යා සමග නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීම සඳහා සහයෝගය දැක්වීමට එකග වන අතර භාණ්ඩවල පළුදු ප්‍රතිශතය අඩු කිරීමෙන් දෙපාර්ශවයේම සුභ සිද්ධියට හා ආයතනයේ අනාගත වර්ධනයට කටයුතු කිරීමට දෙපාර්ශවයම එකග වේ.

06. මෙම ගිවිසුම ක්‍රියාත්මක වන කාලසීමාව තුළ දී මෙහි අන්තර්ගත වන කිසිදු කරුණක් වෙනස් කිරීමට කිසිදු පාර්ශවයක් විසින් නොකළ යුතුය.

**07. ආරාවුල් විසඳීමේ ක්‍රමවේදය**

ආයතනය තුළ මෙම ගිවිසුමෙන් ආවරණය නොවන වෙනත් කිනම් ආකාරයක හෝ ආරාවුලක් මතු වූ අවස්ථාවක දී පහත සඳහන් ආරාවුල් විසඳීමේ ක්‍රමවේදය අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

i. යම් ආරාවුලක් සම්බන්ධයෙන් වූ කාරණාවකදී එම කාරණාව සම්බන්ධයෙන් ලිඛිත ප්‍රකාශයක් මගින් වෘත්තීය සමිති ශාඛා නියෝජිතයන් පාලනාධිකාරිය වෙත දැනුම් දිය යුතු අතර, එය සමථයකට පත් කිරීම සඳහා අවම වශයෙන් සති දෙකක කාලයක් ලබාදිය යුතුය.

ii. පාලනාධිකාරියෙන් ඒ සම්බන්ධව සතුටුදායක විසඳුමක් නොලැබුනු අවස්ථාවලදී එම ආරාවුල ලංකා සේවා සංගමය හා වෘත්තීය සමිති මව් සංගම් නියෝජිතයින් විසින් ආරාවුල විසඳා ගැනීමේ අරමුණින් ඉදිරිපත් කළ යුතුය.

iii. එමගින් විසඳුමක් නොලැබුණු අවස්ථාවකදී අදාළ ආරාවුල කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කර සමථ කරන පිළිවෙත් අනුගමනය කළ යුතුය.

iv. සමථ කරන පිළිවෙත් අනුගමනය කළ පසු ආරාවුල සමථයකට පත් නොවූ අවස්ථාවල දී වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයට යොමුවන්නට අදහස් කරන්නේ නම් ඒ සම්බන්ධව පාලනාධිකාරියට සහ ලංකා සේවා සංගමය වෙත දින දාහතරක (14) පූර්ව ලිඛිත දැනුම්දීමක් කළ යුතුය.

ඉහත සියලු කොන්දේසිවලට එකඟව සියලු අදාළ පාර්ශවයන් මෙකී සාමූහික ගිවිසුමට 2020 ඔක්තෝබර් මස 16 වැනි දින පහත අත්සන තබන ලදී.

**සේවායෝජක පාර්ශවය වෙනුවෙන්**
**මිදායා සෙරමික් කම්පැනි පුද්ගලික සමාගම**

අත්සන ..........
නම .....Anura.....
තනතුර : Managing Director

සී/ස මිදායා සෙරමික් සමාගම
තැ: පෙ: 05
ශාන්ති මාවත
මාකුඹුර, පන්නිපිටිය

**වෘත්තීය සමිති පාර්ශවයේ වෙනුවෙන්**
**අන්තර් සමාගම් සේවක සංගමය**

අත්සන ..........
නම ..........
තනතුර : ..........

සාක්ෂිකරුවන්

අත්සන : ..........
නම : ..........
තනතුර : ..........

සී/ස මිදායා සෙරමික් සමාගම
තැ: පෙ: 05
ශාන්ති මාවත
මාකුඹුර, පන්නිපිටිය

අත්සන : ..........
නම ..........
තනතුර : ..........

EOG 12- 0341